[illegible]
23 [illegible] 1988
[illegible]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 11 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සභානායක සමගන් කළේ 1988 මැයි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මැයි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 48/85

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1988 අංක 11 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

1979 අංක 15 දරන පනතේ 124 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 124 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මහෙස්ත්‍රාත්වරයා විමර්ශනවලට සහාය දිය යුතු බව.

124. විමර්ශනයක් පවත්වා ගෙන යාමට සහාය දෙන ලෙස ඉල්ලීමක් යම් මහේස්ත්‍රාත්වරයකු වෙත කරනු ලැබූ විට, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නිසි ආඥා කිරීමෙන් සහ අධිකරණ නියෝග නිකුත් කිරීමෙන්, ඒ විමර්ශනය පැවැත්වීම සඳහා සහාය දිය යුතු අතර, විශේෂයෙන්ම වරදකරු නිසැකව හඳුනා ගැනීමේ කාර්යය සඳහා හඳුනා ගැනීමේ පෙරට්ටුවක් පැවැත්වීම හෝ පැවැත්වීමට බලය දීම සහ ඒ කාර්යය සඳහා, ඒ පෙරෙට්ටුවට සහභාගී වන ලෙස සැකකරුවකුට හෝ වෙනත් තැනැත්තකුට නියම කිරීම, සාක්ෂිකරුවකුට සැඟවුණු තැනක සිට හඳුනා ගැනීමට අවසර දීම සහ ඒ පෙරෙට්ටුවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නඩු විභාගය ජූරි සභාවක් මගින් සහ ජූරි සභාවක් නොමැතිව පැවැත්විය යුත්තේ කවර අවස්ථාවලදී ද යන වග.

161. මේ සංග්‍රහයෙහි හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණයේ දී පවරනු ලබන සියලුම අපරාධ නඩු ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් විභාග කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, යම් අවස්ථාවක දී යටත් පිරිසෙයින් වරදවල් අතුරෙන් එක් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වරදවල් පිළිබඳ ලැයිස්තුවට වැටෙන අවස්ථාවක ජූරි සභාවක් මගින් නඩුව විභාග කළ යුතු යයි චූදිතයා විසින් තීරණය කළ හොත් පමණක් නඩු විභාගය ජූරි සභාවක් මගින් විනිශ්චයකාරවරයකු ඉදිරියේ පැවැත්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඉඉ) අධිචෝදනා පත්‍රය ජූරි සභාවක් මගින් විභාග කරනු ලැබිය හැකි වරදකට අදාළ වේ නම්, නඩු විභාගය ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු යයි තමා නිරණය කරන්නේ ද නැද්ද යන වග චූදිතයාගෙන් විමසිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 266 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 266 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීමේදී—

(අ) ඒ වරද සම්බන්ධයෙන් වූ අපරාධ නඩුවක් මහේස්ත්‍රාත් අධිකරණයේ නොපවත්නා විට, චූදිතයා නිදොස් කිරීමක බලය නැත්තේ ය;

(ආ) ඒ වරද සම්බන්ධයෙන් වූ අපරාධ නඩුවක් මහේස්ත්‍රාත් අධිකරණයක පවත්නා විට චූදිතයා නිදොස් කිරීමක බලය ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 414 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 414 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) පරීක්ෂාකර හෝ විශ්ලේෂණය කර වාර්තා කිරීම පිණිස තමා වෙත යථා පරිදි ඉදිරිපත් කරන ලද යම් තැනැත්තකු, යම් ද්‍රව්‍යයක් හෝ යම් දෙයක් පිළිබඳව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ, සැකසහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයාගේ, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයාගේ, මෝටර් වාහන පරීක්ෂකවරයාගේ හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරන ලද වාර්තාවක් බවට අදහස් කරනු ලබන යම් ලේඛනයක් හෝ, ආණ්ඩුවේ විකිරණවේදියකු විසින් පිළියෙල කරන ලද්දක් බවට අදහස් කරනු ලබන ස්ක්‍රියා ප්‍රස්තාරයක් මත පදනම් වූ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ වාර්තාවක් හෝ එම ස්ක්‍රියා ප්‍රස්තාරය ම සහ එම ස්ක්‍රියා ප්‍රස්තාරය සම්බන්ධයෙන් එම විකිරණවේදියාගේ අත්සන යටතේ වූ වාර්තාවක් බවට අදහස් කරනු ලබන යම් ලේඛනයක්, එම නිලධරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද, මේ සංග්‍රහය යටතේ වූ යම් පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් භාවිත කරනු ලැබිය හැකිය :

එසේ වුවද එලෙසින් පරීක්ෂණයට හෝ විශ්ලේෂණයට භාජනය කොට වාර්තා කරනු ලැබූ තැනැත්තාගේ, ද්‍රව්‍යයේ හෝ දෙයෙහි අනන්‍යතාව ඔප්පු කිරීමේ අවශ්‍යතාව කෙරෙහි මේ වගන්තියේ සඳහන් කිසිවක් බල නොපෑ යුතු ය.";

(ආ) එම වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5අ) (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකුගේ ධුරයට අයත් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී එම රජයේ නිලධරයා විසින් කරන ලද යම් ක්‍රියාවකට අදාළ වූ ද, දිවුරුම් පත්‍රයකින් සත්‍යායනය කරනු ලැබුවාවූ ද, එම රජයේ නිලධරයාගේ ලිඛිත ප්‍රකාශය, මේ සංග්‍රහය යටතේ වූ යම් පරීක්ෂණයක දී, නඩු විභාගයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී, එම නිලධරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබුව ද, සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.";

(ඇ) එම වගන්තියේ (6) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා හෝ වෙනත් වෛද්‍ය සාක්ෂිකරුවකු හෝ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා හෝ සැක සහිත ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා හෝ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා හෝ මෝටර් වාහන පරීක්ෂකවරයා හෝ ආණ්ඩුවේ විකිරණවේදියා හෝ මහේස්ත්‍රාත්වරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයා හෝ භාෂණ පරිවර්තකවරයා හෝ ඉහතින් ම වූ උපවගන්තිවල සඳහන් කර ඇති වෙනත් යම් සාක්ෂිකරුවකු හෝ එම දිවුරුම් සාක්ෂිය හෝ වාර්තාව අදාළවන යම් විශේෂ නඩු විභාගයක දී සාක්ෂි දීම සඳහා පැමිණිය යුතු බව යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම මත හෝ අන්‍යාකාරයෙන් හෝ වාර්තා කරනු ලැබිය යුතු හේතු නිසා අවශ්‍ය වන බව, යම් නඩුවක දී එම නඩුව විභාග කරන අධිකරණයේ මතය වන්නේ නම්, පැමිණිල්ලේ වෙනත් සාක්ෂිකරුවන් කැඳවූ ආකාරයට ම, සාක්ෂිදීමේ කාර්යය සඳහා ඒ නිලධරයන් ද සාක්ෂිකරුවන් වශයෙන් කැඳවනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 419 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 419 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(1) XV වන පරිච්ඡේදය යටතේ මූලික සාක්ෂි විභාගය අවසන් කළ විට, යම් තැනැත්තෙක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් හඳුනා ගත් බව, හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් පැවැත්වූ බව සහ,

නිශ්චිත සාක්ෂිකරුවකු විසින්, ඒ හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ දී නිශ්චිත තැනැත්තකු හඳුනාගත් බව, යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් නිශ්චිත තැනැත්තකු ඉදිරිපිට දී මුද්‍රා තබා පරීක්ෂණය සහ විශ්ලේෂණය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවනු ලැබූ බව, විශ්ලේෂණය සහ පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවන ලද නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් ඔහු විසින් ඒ පරීක්ෂණය සහ විශ්ලේෂණය කිරීමෙන් පසු අධිකරණය වෙත ආපසු එවන ලද බව, නිශ්චිත මිනුමක් හෝ සටහනක් නිශ්චිත තැනැත්තකු විසින් කරන ලද බව යන කරුණු ඇතුළුව විවාදයට භාජන වූ කරුණු හෝ විවාදයට භාජනය වූ කරුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පිළිගැනීම් කිසිවක් කිරීමට චූදිත තැනැත්තා එකඟ වන්නේ දැයි චූදිත තැනැත්තාගෙන් විමසීම අධිකරණයේ කාර්යය වන්නේ ය. තව ද, චූදිත තැනැත්තා එවැනි යම් පිළිගැනීමක් කිරීමට තම නීතිඥවරයා මඟින් එකඟ වුවහොත්, ඒ එකඟවුණු කාරණා පිළිබඳව සටහනක් මහෙස්ත්‍රාත්වරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ සටහන චූදිතයාට වැටහෙන භාෂාවකින් කියවා, තේරුම් කර දිය යුතු ය. ඒ සටහන පිළිගැනීම පිළිබඳ නිවැරදි වාර්තාවක් බවට චූදිතයා එකඟ වුවහොත්, ඔහු සටහනට අත්සන් තැබිය යුතු අතර, ඒ සටහන නඩු වාර්තාවට ගොනු කරනු ලැබිය යුතු ය. මහාධිකරණය විසින්, චූදිත තැනැත්තා වෙත දණ්ඩන නියම කරනු ලබන විට, එම තැනැත්තා මේ වගන්තිය යටතේ පිළිගැනීමක් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 420 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 420 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ලෙස ඒ වගන්තිය නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) නැවත අංක කරන ලද (2) වන උපවගන්තියට පෙරටුව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1) ලඝු ආකාරයෙන් වූ සෑම නඩු පැවරීමක් හෝ අධිචෝදනා පත්‍රයක් මත වූ සෑම නඩු විභාගයක් ආරම්භයේ දී යම් තැනැත්තකු හෝ කාරණාවක් හෝ දෙයක් හඳුනාගත් බව, හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් පැවැත් වූ බව සහ එම පෙරෙට්ටුවේදී නිශ්චිත සාක්ෂිකරුවකු විසින් නිශ්චිත තැනැත්තකු හඳුනාගනු ලැබූ බව, යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් නිශ්චිත තැනැත්තකු ඉදිරියේ දී මුද්‍රා තබනු ලැබ, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ බව, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත යවන ලද යම් නිශ්චිත ද්‍රව්‍යයක් හෝ දෙයක් පරීක්ෂණයෙන් සහ විශ්ලේෂණයෙන් පසු ඔහු විසින් අධිකරණය වෙත ආපසු එවනු ලැබූ බව, යම්

නිශ්චිත මිනුම හෝ දළ සටහන යම් නිශ්චිත තැනැත්තකු විසින් කරන ලද බව යන කරුණු ඇතුළුව විවාදයට භාජන වූ කරුණු හෝ විවාදයට භාජන වූ කරුණුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පිළිගැනීම් කිසිවක් කිරීමට චූදිත තැනැත්තා එකඟවන්නේ දැයි ඔහුගෙන් විමසීම අධිකරණයේ කාර්යය වන්නේ ය. තවද, චූදිත තැනැත්තා විසින් එවැනි යම් පිළිගැනීමක් කිරීමට තම නීතිඥවරයාගේ මාර්ගයෙන් එකඟ වුවහොත්, අධිකරණය විසින් එම පිළිගැනීම වාර්තා කළ යුතු ය. අධිකරණය විසින්, චූදිත තැනැත්තා වෙත දණ්ඩන නියමය කරන විට, එම තැනැත්තා විසින් මේ වගන්තිය යටතේ පිළිගැනීමක් කර ඇති බව සැලකිල්ලට ගත යුතු ය. ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 451 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 451 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මේ සංග්‍රහයෙහි හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, 450 වන වගන්තිය යටතේ පවත්වන ලද නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරන ලද යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ ආඥාවකට විරුද්ධව චූදිත තැනැත්තකු විසින් අභියාචනා කරනු ලැබිය හැකි ය. ".

10. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී— අන්තර් කාලීන විධිවිධාන.

(අ) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති යම් වරදක් සම්බන්ධයෙන් වූ ; සහ

(ආ) කිසිම සාක්ෂියක් ඉදිරිපත් නොකරනු ලැබූ නඩුවක් යම් මහාධිකරණයක විනිශ්චයට භාජන වෙමින් පවතින අවස්ථාවක මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, නැතහොත්, චූදිතයා විසින් ජූරිසභික මූල මණ්ඩලයක් තෝරාගෙන ජූරි සභාවක් තෝරා ගනු ලැබ තිබුණ ද, නඩු විභාගය ජූරි සභාවක් මගින් පැවැත්විය යුතු යයි තමා තීරණය කරන්නේ ද නැද්ද යන වග විනිශ්චයකාරවරයා විසින් චූදිතයාගෙන් විමසිය යුතු ය. ජූරි සභාවක් නොමැතිව නඩුව විභාග කළ යුතු බවට චූදිතයා තීරණය කළහොත් ජූරි සභාවක් නොමැතිව ඔහු පිළිබඳ නඩු විභාගය පවත්වාගෙන යාමට විනිශ්චයකාරවරයා විසින් කටයුතු කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය